# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/3 – 2020 අගෝස්තු 17 වැනි සඳුදා – 2020.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 212 මධ්‍යම වහරෙයි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වහරෙයි ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක BT/KPN/2019/131 හා 2019.07.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – මුහත්තුවර පූමි – ප්‍රමාණය: හෙක්. 0.4047**

උතුරට: එස්. ආම්ස්ට්‍රෝන් හිමිකම් කියන මුහත්තුවර පූමි ගෙවත්ත සහ මුහුද; නැගෙනහිරට: මුහුද සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි මුහත්තුවර පූමි ගෙවත්ත; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මුහත්තුවර පූමි ගෙවත්ත සහ පනිච්චන්කේනි ආරු; බටහිරට: පනිච්චන්කේනි ආරු සහ එස්. ආම්ස්ට්‍රෝන් හිමිකම් කියන මුහත්තුවර පූමි ගෙවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/17/2019/D/23.<br>
2020 ජූලි මස 15 වැනි දින.<br>
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,<br>
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

09 – 06

1A – G 32678 – 07 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*